මැයි 21, 2023 දින මිරිහානේදී පැවැත්වුණු දේව පූජාවකට සූම් (Zoom) ඔස්සේ සම්බන්ධ වූ පාස්ටර් ජෙරොම් ප්‍රනාන්දු, ඔහු විසින් මින් පෙර කළ ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන ලදී.
ඔහුගේ එම අදහස් දැක්වීමේ මෙසේ සඳහන් වේ. "එදින මම දේශනා කළේ සැබෑ ශුභාරංචියයි. මම දේශනා කළේ බයිබලයේ සඳහන් වන දෙයයි. මම කිසිම වරදක් කර නොතිබුණත්, මට තවමත් මගේ බෞද්ධ සහෝදරවරුන්ගෙන්, හින්දු සහෝදරවරුන්ගෙන්, සහ මුස්ලිම් සහෝදර සහෝදරියන්ගෙන්, මගේ වචන කිසිමාකාර විදියකින් ඔබේ හැඟීම් රිදවුවා නම් සමාව ඉල්ලා සිටීමට උවමනායි. ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන්ගෙන් මම යටහත්ව සමාව ඉල්ලා සිටිනවා."
පාස්ටර් ජෙරොම් ප්‍රනාන්දු ගේ මෙම ප්‍රකාශය සම්බන්ධයෙන්, මැයි 22, 2023 දින වාර්තා කර තිබූ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පුවත්පත් සිරස්තල පහත පරිදි දැක්විය හැක.
ඒ අනුව,
පාස්ටර් ජෙරොම් ප්‍රනාන්දු ගේ ප්‍රකාශය සහ සමාව ඉල්ලීම, වඩාත් නිවැරදිව වාර්තා වී ඇත්තේ කුමන පුවත් සිරස්තල(ය) තුළ ද?
මූලාශ්‍ර:
https://www.instagram.com/reel/CsicA6xBwD3/?igshid=MzRlODBiNWFlZA==
https://slpi.lk/wp.../uploads/2021/07/Editors-Code-Eng.pdf
https://www.ap.org/.../news.../telling-the-story/quotations
http://www.rightsofwriters.com/.../what-are-risks-of...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# පාස්ටර් ජෙරොම්ගේ ප්‍රකාශය වඩාත් නිවැරදිව වාර්තා කර ඇත්තේ කවුරුන්ද?

## ජෙරොම් සමාව ගනී



මව්බිම

## සිත් රිදීමක් වුණානම් සමාවන්න: මගේ මතයේ වෙනසක් නෑ

ජෙරම් ප්‍රනාන්දු සූම් තාක්ෂණයෙන් කියයි



ලංකාදීප



## ජෙරොම් ඔන්ලයින් ඔස්සේ සමාව ඉල්ලයි:

දේව මෙහෙයට අනුගාමිකයෝ ආරක්ෂාව ඉල්ලති: පොලිසිය බැහැ කියයි

දිවයින

## Self-proclaimed ‘prophet’ Jerome apologises for ‘hurting feelings’



ස්වයං-ප්‍රකාශිත 'දිවැසිවර' ජෙරොම්, 'සිත් රිදවීම' ගැන සමාව ඉල්ලයි

(සිංහලට පරිවර්තනය - **Ethics Eye**)

CEYLON TODAY

## Jerome apologises to Buddhists, Muslims, Hindus



ජෙරම්, බෞද්ධ, මුස්ලිම්, සහ හින්දු බැතිමතුන්ගෙන් සමාව ඉල්ලයි (සිංහලට පරිවර්තනය - **Ethics Eye**)

DailyMirror

මැයි 22, 2023 දින තෝරාගත් සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් සිරස්තල දත්ත ඇසුරිණි

ETHICS EYE